# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1833/29 – 2013 ඔක්තෝබර් 25 වැනි සිකුරාදා – 2013.10.25

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/10/28/2007.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2009.09.09 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ කොළඹ 06, වැල්ලවත්ත, පැරකුම්බා පෙදෙස, අංක 27/121 හි පදිංචි පී. කේ. ප්‍රජිත මහතා සහ කොළඹ 01, ඇවිලන් චතුරස්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, අංක 21-01 හි පිහිටි ඒසියා කැපිටල් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබාදෙන ලද අංක ඒ 3298 දරන ප්‍රදානය 2012.12.06 දිනැති හා අංක 1787/32 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2013.10.01 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,<br>
කම්කරු කොමසාරිස්.

2013 ඔක්තෝබර් මස 14 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

නඩු අංකය: ඒ 3298

පී. කේ. ප්‍රජිත මහතා, අංක 27/121, පැරකුම්බා පෙදෙස, වැල්ලවත්ත, කොළඹ 06.

*ඉල්ලුම්කරු,*

එරෙහිව

ඒසියා කැපිටල් ලිමිටඩ්, අංක 21-01, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 01.

*වගඋත්තරකරු,*

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) ගේ 2013.06.24 දින ලිපිය ප්‍රකාර අර්ථ නිරූපනය පහත සඳහන් කරමි.

2012.10.05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද පී. කේ. ප්‍රජිත මහතා එදිරිව ඒසියා කැපිටල් ලිමිටඩ් යන බේරුම්කරන නීති කෘතියේ ඉල්ලුම්කරු සඳහා වර්ෂ 2012 ක් වූ අගෝස්තු මස 13 වැනි දින දෙන ලද ප්‍රදානය ක්‍රියාත්මක කිරීම කළ යුතු දිනය ලෙස *ගැසට් පත්‍රය* පළවී දෙමසක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු බවට මම අර්ථ නිරූපණයකොට මෙයින් ඉදිරිපත් කරමි.

එම්. ආරිෆ්,
බේරුම්කරණ මණ්ඩලයේ සාමාජික.

2013 ඔක්තෝබර් මස 23 වැනි දින,
කාර්මික අධිකරණය.

11 – 323

---

මගේ අංකය: අයිආර්/10/28/2007(ඒ).

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2009.11.19 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ උස්වැටකෙයියාව, පට්ටියවල, අංක 272/බී හි පදිංචි එස්. ඩී. එස්. ඒ. රේමන්ඩ් මහතා සහ කොළඹ 01, ඇව්ලන් චතුරස්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, අංක 21-01 හි පිහිටි ඒසියා කැපිටල් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබාදෙන ලද අංක ඒ 3309 දරන ප්‍රදානය 2012.10.05 දිනැති හා අංක 1778/44 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2013.10.01 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ඔක්තෝබර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

නඩු අංකය: ඒ 3309

එස්. ඩී. එස්. ඒ. රේමන්ඩ් මහතා, අංක 272/බී, පට්ටියවල, උස්වැටකෙයියාව.

*ඉල්ලුම්කරු,*

එරෙහිව

ඒසියා කැපිටල් ලිමිටඩ්, අංක 21-01, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇව්ලන් චතුරශ්‍රය, කොළඹ 01.

*වගඋත්තරකරු,*

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධවයි.

කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) ගේ 2013.06.24 දින ලිපිය ප්‍රකාර අර්ථ නිරූපනය පහත සඳහන් කරමි.

2012.10.05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද එස්. ඩී. එස්. ඒ. රේමන්ඩ් මහතා එදිරිව ඒසියා කැපිටල් ලිමිටඩ් යන බේරුම්කරන නීති කෘතියේ ඉල්ලුම්කරු සඳහා වර්ෂ 2012 ක් වූ අගෝස්තු මස 13 වැනි දින දෙන ලද ප්‍රදානය ක්‍රියාත්මක කිරීම කළ යුතු දිනය ලෙස *ගැසට් පත්‍රය* පළවී දෙමසක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු බවට මම අර්ථ නිරූපණයකොට මෙයින් ඉදිරිපත් කරමි.

එම්. ආරිෆ්,
බේරුම්කරණ මණ්ඩලයේ සාමාජික.

2013 ඔක්තෝබර් මස 23 වැනි දින,
කාර්මික අධිකරණය.

11 – 324

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.